Australian Government

COVID-19 VACCINATION

# Spikevax (Moderna) COVID-19 එන්නත සම්බන්ධ තොරතුරු

අවසාන වරට යාවත්කාලීන කළේ 2021 සැප්තැම්බර් 15 වන දිනදීය

## එන්නත සම්බන්ධව

**Moderna** එන්නත මගින් මිනිසුන් COVID-19 ආසාදනය මගින් අසනීපවීම වළක්වා ගත හැකිය. සති 4-6 කාල පරතරයක් ඇතිව මාත්‍රා දෙකක් අවශ්‍යවේ (විශේෂ අවස්ථානුගත තත්වයන් යටතේ කාලය දීර්ඝ විය හැකිය). Moderna COVID-19 එන්නතෙහි කිසිදු ජීවී වයිරසක් අඩංගු නොවන අතර ඔබට COVID-19 ආසාදනය වැළදිය නොහැක. ස්පයික් ප්‍රෝටීන් ලෙස හඳුන්වන SARS-CoV-2 වයිරසයේ වැදගත් කොටසක ජාන කේතය එහි අඩංගුවේ. එන්නත ලබා ගැනීමෙන් පසුව ඔබගේ සිරුර මගින් ස්පයික් ප්‍රෝටීනයේ පිටපත් සකස් කරයි. ඉන්පසු ඔබගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය, COVID-19 ඇති කරන SARS-CoV-2 වයිරසය හඳුනාගෙන එයට විරුද්ධව සටන් කිරීමට ඉගෙන ගනී. ජාන කේතය ඔබගේ සිරුර මගින් වේගයෙන් බිඳ දමයි.

COVID-19 වැළැක්වීම සඳහා, එන්නත සඳහා සුදුසුකම ඇති සියළුම අය එන්නත ලබා ගත යුතුය. මෙයට මෙම විස්තර පත්‍රිකාවේ ඇතුලත් බැහැර කිරීම් කිහිපයක් ඇත. එන්නත ලබා ගැනීම ස්වේච්ඡාවෙන්වේ. ඔබ එන්නත ලබා ගැනීමට පෙර COVID-19 සම්බන්ධයෙන් ඇති ගැටළුවක් හෝ කනස්සල්ලක් ඇතිනම්, එන්නත සපයන්නා සහ/හෝ ඔබගේ වෛද්‍යවරයා සමඟ කථා කල හැකිය.

## එන්නතෙහි ප්‍රතිලාභ

අති විශාල චිකිත්සක අත්හදා බැලීමක් මගින් පෙන්වා දුන්නේ වයස අවුරුදු ≥12 සහ ඊට වැඩි අය සම්බන්ධයෙන් COVID-19 වැළැක්වීම සඳහා Moderna ඵලදායී බවයි. එන්නත ලබා නොගත් අයට වඩා Moderna මාත්‍රා දෙකක් ලබාගත් අයගෙන් සියයට 94 ක් හට කෝවිඩ්-19 ආසාදනය ඇතිවීමේ හැකියාව අඩුය. එය වයස අවුරුදු 65 ට වඩා වැඩි අය (86%) වයස අවුරුදු 12-17 අතර තරුණයන් අතරද එන්නත ඵලදායීවේ.

COVID-19 ට එරෙහි ආරක්ෂාව ආරම්භ වන්නේ පළමුවන මත්‍රාව ලබා සති 2-3 කට පමණ පසුවය. එක් මාත්‍රාවක් මගින් තරමක් ආරක්ෂාව ලබා දුන්නද එය පවතින්නේ කෙටි කාලයක් සඳහා පමණි. මාත්‍රා දෙකක් මගින් ප්‍රශස්ථ ආරක්ෂාව ලබාදේ. කිසිම එන්නතක් සියයට සීයක් සපල නොවන අතර ඔබට එන්නතට පසුව වුවද COVID-19 ආසාදනය වීමේ හැකියාව ඇත. Moderna මගින් ලබාදෙන ආරක්ෂාව කොතරම් කල් පවතීද යන්න අපි නොදනිමු. කාලයාගේ ඇවෑමෙන් අපි මේ සම්බන්ධ වැඩිදුර විස්තර ඉගෙන ගනිමු. වයිරසය පැතිරීම වැළැක්වීම සම්බන්ධයෙන් COVID-19 එන්නත කොතරම් ඵලදායීද යන්න අපි දැනට දන්නේ නැත. මෙයින් අදහස් වන්නේ තවදුරටත් එන්නත් ලබාදුන් අයෙකු හට COVID-19 ආසාදනය විය හැකි බවයි. ඔවුනට රෝග ලක්ෂණ හෝ සුළු රෝග ලක්ෂණ නොතිබුණද ඔවුන් විසින් වයිරසය වෙනත් අයෙකුට ආසාදනය කල හැකි බවයි.

මේ හේතුව නිසයි පහත ඇති පූර්වාරක්‍ෂක ක්‍රියා මාර්ග තව දුරටත් ගැනීම වැදගත් වන්නේ:

- ශාරීරික දුරස්ථභාවය
- අත් සේදීම
- මුහුණු ආවරණ පැළඳීම
- ඔබගේ ප්‍රාන්තය/ටෙරිටරිය මගින් අවශ්‍ය වන පරිදි COVID-19 පරීක්‍ෂා/හුදෙකලාවීම.

ඔබව Moderna මාත්‍රා දෙකක් මගින් එන්නත ලබාදී ඇතිනම්, ඔබගේ පළාත් සෞඛ්‍යය අධිකාරීන් මගින් නියම කරන ආකාරයට ඔබ පරීක්‍ෂණ කර ගැනීමේ අවශ්‍යතා සපුරාලන්නේ නම් (උදා. උණ, කැස්ස, උගුරේ ආසාදන), ඔබ විසින් කෝවිඩ්-19 පරීක්‍ෂණයක් කර ගත යුතුය.

## මෙම එන්නත ලබා ගත හැක්කේ කවුරුන් හටද

ප්‍රතිකර්ම භාණ්ඩ පරිපාලනය (Therapeutic Goods Administration (TGA)) මගින් Spikevax (Moderna) එන්නත වයස අවුරුදු ≥ 12 අය සඳහා භාවිත කිරීමට තාවකාලික අනුමැතිය ලබාදී ඇත.

## මෙම එන්නත ලබා ගත යුතු නැති අය කවුරුන්ද

ඔබට පහත දේ සිදුවුණි නම් මෙම එන්නත ලබා ගත යුතු නැත:

- mRNA COVID-19 කෝවිඩ්-19 එන්නතේ කලින් මාත්‍රාවකට (උදා.Moderna හෝ Comirnaty (Pfizer))) ඇනෆිලැක්සිස් (දරුණු අසාත්මිකතා ප්‍රතිචාර) ඇතිවූ අය
- පොලිඑතිලීන් ග්ලයිකෝල් (PEG) ඇතුළු එන්නතේ කිසියම් සංඝටකයකට නිරාවරණය වීමෙන් පසු ඇනෆිලැක්සිස් ඇතිවූ අය
- කලින් mRNA COVID-19 එන්නත් (උදා.Moderna හෝ Pfizer) මාත්‍රාවකට පසු මයෝකාඩයිටිස් සහ/හෝ පෙරිකාඩයිටිස් ඇතිවීම
- කලින් mRNA COVID-19 එන්නත් (උදා. Moderna හෝ Pfizer) මාත්‍රාවකට පසු, වෙනත් කිසිවක් හේතුවක් හඳුනා නොගත්, වෙනත් දරුණු අහිතකර ප්‍රතිචාරයක් ඇතිවීම. මෙය පළපුරුදු එන්නත් සපයන්නෙකු හෝ වෛද්‍ය විශේෂඥයෙකුගේ සමලෝචනයකට පසුව විය යුතුය.

## එන්නත සම්බන්ධ පූර්වාරක්‍ෂණ

සමහර රෝගී තත්වයන් ඇති අය විසින් එන්නත ලබා ගැනීමෙන් පසු මිනිත්තු 30 ක් නිරීක්‍ෂණය සඳහා සිටීම හෝ අසාත්මිකතා සම්බන්ධ විශේෂඥයෙකු හමුවීම වැනි අමතර පූර්වාරක්‍ෂාවන් ගත යුතුය. පහත දේ අදාල නම්, ඔබගේ එන්නත් සපයන්නා හට දැනුම් දෙන්න:

- කලින් මාත්‍රාවකට හෝ mRNA COVID-19 එන්නතේ අඩංගු **දෙයකට අසාත්මික ප්‍රතිචාරයක්** ඇතිවීම (උදා. Moderna හෝ Pfizer)
- **වෙනත් එන්නත් හෝ බෙහෙත් සම්බන්ධයෙන් ඇනෆිලැක්සිස් ප්‍රතිචාරයක් තිබුණි නම්.** ඔබ ලබන COVID-19 එන්නතෙහි අඩංගු දේ හා සමාන දේ තිබුණිද යන්න සනාථ කර ගැනීමට ඔබගේ එන්නත් සපයන්නා විසින් සෝදිසි කර බැලිය හැකිය
- ප්‍රතිකාර අවශ්‍ය මෑතකදී නැවත නැවත ඇතිවුණු ඇනෆිලැක්සිස් සමඟ සනාථවුණු මාස්ටෝසයිටෝසිස්

ඔබට **රුධිර වහනය වන රෝගයක් ඇතිනම්** හෝ ඔබ රුධිරය **තුනීවීම සඳහා බෙහෙත් ලබා ගන්නේ නම්** (ඇන්ටිකෝඇගියුලන්ට්), ඔබගේ එන්නත් ලබා දෙන්නා හට ඒ බව දැනුම් දෙන්න. ඔබගේ එන්නත් සපයන්නා විසින් ඔබට පේශීන් තුලට ලබාදෙන (intramuscular) එන්නතක් ලබාදීම හෝ එන්නත සඳහා සුදුසුම කාලය තීරණය කිරීමට උපකාර කල හැකිය.

## එන්නත ලබා ගැනීමට පෙර සාකච්ඡා කලයුතු විශේෂ අවස්ථානුගත කරුණු

### Moderna සම්බන්ධයෙන් පූර්වාරක්‍ෂණ කොන්දේසි ඇති අය

පහත තත්වයක් සම්බන්ධ ඉතිහාසයක් ඇති අය විසින් Moderna ලබා ගත හැකි වුවද, එන්නත ලබා ගත හැකි හොඳම කාලය සහ අමතර පූර්වාරක්‍ෂණයන් ගත යුතුද යන්න නිර්දේශ ලබා ගැනීම සඳහා සාමාන්‍ය වෛද්‍යවරයෙකුගෙන්, ප්‍රතිශක්තිකරණ විශේෂඥයෙකුගෙන් හෝ හෘද රෝග විශේෂඥයෙකුගෙන් උපදෙස් ලබා ගත යුතුය:

- මෑත කාලීන (පසුගිය මාස 6 ඇතුලත) හෝ වර්තමාන ප්‍රදාහ හෘද රෝගය උදා. මයෝකාඩයිටිස්, පෙරිකාඩයිටිස්, එන්ඩොරඩයිටිස්
- ඇකියුට් රූමටික් ෆීවර් (එනම්. ඇක්ටිව් මයෝකාඩියල් ප්‍රදාහය) හෝ ඇකියුට් රූමටික් හෘද රෝගය
- දරුණු ලෙස හෘදය අසමත්වීම

### දුර්වලවූ ප්‍රතිශක්තිකරණ පද්ධතියක් ඇති අය (ප්‍රතිශක්තිකරණය හීනවූ)

ප්‍රතිශක්තිකරණය හීනවූ අය අතර සිය ප්‍රතිශක්තිකරණ පද්ධතිය හීනවන රෝග තත්වයක් ඇති අය සිටී. සිය ප්‍රතිශක්තිකරණ පද්ධතිය හීන කරන බෙහෙත් ලබා ගන්නා අයද සිටී.

ප්‍රතිශක්තිකරණය හීනවූ අය විසින් COVID-19 එන්නත ලබාගත යුතු බවට ඕස්ට්‍රේලියානු රජය විසින් තරයේ නිර්දේශ කරයි. Moderna ජීවී එන්නතක් ලෙස හැසිරෙන්නේ නැත. එය ප්‍රතිශක්තිය හීනවූ අය අතර භාවිතය සඳහා ආරක්ෂාකාරීවේ.

ප්‍රතිශක්තිකරණය හීනවූ අය අතර එච්.අයි.වී. සමඟ ජීවත්වන අය, COVID-19 හේතුවෙන් මරණය ඇතුළුව දරුණු අසනීප ඇතිවීමේ අවදානම ඇති අය සිටී.

Moderna සම්බන්ධ චිකිත්සක අත්හදා බැලීම් කල අය අතර ප්‍රතිශක්තිය හීනවූ අය නොසිටින ලදී. නමුත් එච්.අයි.වී. තිබී ස්ථාවරවූ අය කුඩා කණ්ඩායමක් සිටින ලදී. අන් ජනගහණය සමඟ සැසඳීමේදී ප්‍රතිශක්තිකරණය හීනවූ අය අතර Moderna එන්නත ඵලදායිද යන්න අපි නොදනිමු. සාමාන්‍ය ජනගහණය හා සැසඳීමේදී ප්‍රතිශක්තිය හීනවූ අය අතර එය ඵලදායී නොවිය හැකි අතර එන්නත ලබා ගැනීමෙන් පසු ශාරීරික දුරස්ථභාවය වැනි පූර්වාරක්ෂණ ක්‍රියා මාර්ග දිගටම ගැනීම වැදගත්වේ.

### ගර්භනී, හෝ දරුවන්ට කිරි ලබා දෙන මව්වරුන්

ගර්භනී කාන්තාවන් සහ තරුණ අය සඳහා Pfizer හෝ Moderna වැනි mRNA-පදනම්වූ COVID-19 එන්නත් ඕනෑම ගර්භනී අවස්ථාවක ලබා දිය යුතුය. ඔබ ගර්භනීවීමට බලාපොරොත්තුවෙන් සිටී නම්, එන්නත ලබා ගැනීම ප්‍රමාද කිරීම හෝ එන්නත ලබා ගැනීමෙන් පසු ගර්භනීවීම වැළැක්වීම නොකල යුතුය.

COVID-19 ආසාදනය ඇති ගර්භනී කාන්තාවන් හට දරුණු අසනීප හෝ අහිතකර ගර්භනී බවේ ප්‍රතිඵල ඇතිවිය හැකිය. සත්‍ය සාක්ෂි මගින් පෙන්වා දී ඇත්තේ ගර්භනී කාන්තාවන් සහ මව් කිරි ලබා දෙන කාන්තාවන් හට ආරක්ෂාකාරී බවයි. එන්නත ලබා දෙන වේලාව සම්බන්ධ තීරණය ගැන ඔබගේ සෞඛ්‍යය වෘත්තිකයා සමඟ සාකච්ඡා කල හැක.

ඔබ මව් කිරි ලබා දෙන්නේ නම්, ඔබට Moderna ලබා ගත හැකිය. එන්නත ලබා ගැනීමෙන් පසු මව් කිරි ලබා දීම නැවැත්වීම අවශ්‍ය නැත.

### කෝවිඩ්-19 ඉතිහාසයක් ඇති අය

ඔබට කිසි දිනක COVID-19 ආසාදනයක් තිබුණි නම්, ඔබගේ එන්නත් සපයන්නා හට ඒ බව දැනුම් දෙන්න. ඔබට COVID-19 එන්නත ලබා දීමට පෙර සුවවී මාස හයක් සිටින ලෙසට ඔබගේ එන්නත් සපයන්නා විසින් උපදෙස් ලබා දෙනු ඇත. ඔබට COVID-19 හේතුවෙන් දිගින් දිගට අසනීප නම්, ඔබට ප්‍රතිකාර කරන වෛද්‍යවරයා සමඟ එන්නත සඳහා වඩාත්ම යහපත් කාලය සාකච්ඡා කර ගන්න.

### Moderna සහ දරුවන්

Moderna තාවකාලික වශයෙන් අනුමත කර ඇත්තේ වයස අවුරුදු ≥ 12 හෝ ඊට වැඩි අයට වන අතර, ඊට වඩා වයසින් අඩු අයට ලබා දිය නොහැක.

## Moderna හි ආරක්ෂාව සහතික කිරීම

එන්නත් පර්යේෂණ සඳහා වැඩිපුර මුදල් ප්‍රදාන සහ පර්යේෂණ අධ්‍යයනයන් සඳහා බොහෝ ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වූ අය සිටීම හේතුවෙන් Moderna සහ වෙනත් COVID-19 එන්නත ඉතා ඉක්මණින් දියුණු කරන ලදී. 30,000 පමණ විශාල කණ්ඩායමක් සම්බන්ධවී කල විශාල සායනික අත්හදා බැලීම් මගින් සනාථවූයේ Moderna ආරක්ෂාකාරී සහ ඵලදායී බවයි.

TGA මගින් ඕස්ට්‍රේලියාවේ සියළුම එන්නත් ඇගයීම සිදු කරයි. මේ මගින් එන්නතක් අනුමත කිරීම සඳහා එය ආරක්ෂාකාරී, ඵලදායී සහ ඉතා ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු බවට සහතික විය යුතුය. කෝවිඩ්-19 එන්නත් අනුමත කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ විස්තරයක් TGA වෙබ් අඩවියේ ඇත.

COVID-19 ආරක්ෂාකාරීබව සම්බන්ධයෙන් COVID-19 ප්‍රතිශක්තිකරණ වැඩසටහන පුරාම නියාමනය කරනු ලැබේ.

Vaxzevria (AstraZeneca) එන්නත ලබාගත් පසු රුධිර පට්ටිකා ප්‍රමාණය අඩුවීම සමඟ රුධිරය කැටි ගැසීම ඇතුලත් විරල අතුරු ආබාධයක් වාර්තාවී ඇත. ඇස්ට්‍රාසෙනකා එන්නත නිපදවන්නේ Moderna ආකාරයට වඩා වෙනස් ආකාරයකටය. මෙම වෛද්‍ය තත්වය Moderna COVID-19 එන්නත හා සම්බන්ධකමක් ඇති බවට කිසිදු සාක්ෂි නොමැත.

සැක කරනු ලබන අතුරු ආබාධ සම්බන්ධයෙන් ඔබගේ ප්‍රතිශක්තිකරණ සපයන්නා හෝ වෙනත් සෞඛ්‍ය රැකවරණ වෘත්තීකයන් හට වාර්තා කල හැක. ඔවුන් විසින් ඔබ වෙනුවෙන් ඔබගේ ප්‍රාන්ත හෝ ටෙරිටරි සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත හෝ කෙළින්ම TGA වෙත විධිමත් වාර්තාවක් යවනු ඇත.

ඔබ විසින් කෙළින්ම වාර්තා කිරීමට කැමති නම්, COVID-19 එන්නත සම්බන්ධ සැක කරන අතුරු ආබාධ වාර්තා කරන ආකාරය සම්බන්ධ තොරතුරු සඳහා TGA වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.